## Abstract 23

# හින්දු සහ බෞද්ධ සංස්කෘතිවල බෝධිය හා සම්බන්ධ පුදපූජා පිළිබඳ තුලනයක්

**ඉෂාරා මදුෂානි,**
(ශාස්ත්‍රවේදී (විශේෂ) තෙවන වසර - බෞද්ධ සංස්කෘතිය),
*isharamadushani41@gmail.com,*

වෘක්ෂ වන්දනාව වූ කලී මානව ශිෂ්ටාචාරයේ ප්‍රාරම්භක අවධිය දක්වා දිවයන වන්දනා ක්‍රමයකි. මිනිසා මානවීය ක්‍රියාකාරිත්වය ආරම්භ කළේ යම් දිනක ද එදින පටන් ම වෘක්ෂයන් උදෙසා ඉමහත් සැලකිල්ලක් හා ගෞරවයක් දැක්වීමට පුරුදු වී සිටියේ ය. එලෙස පුදපූජාවට පාත්‍ර වූ වෘක්ෂයක් ලෙසට **ඇසතු** වෘක්ෂය හෙවත් **බෝධි වෘක්ෂයට** සුවිශේෂ ස්ථානයක් හිමි වේ. භාරතීය ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට ම වෘක්ෂයන් අතර ඇසතු වෘක්ෂයට මෙබඳු වටිනාමක් හිමි වූ ආකාරය හා ඊට හේතු වූයේ කවරක් ද යන ගැටලුවට හේතු ගවේශනය කිරීම මෙම පර්යේෂණයේ අරමුණ වේ. මෙහි දී එය දිව්‍යමය ගුණයෙන් හෙබි ශුද්ධ වෘක්ෂයක් ලෙස සැලකූ බවට සාධක තිබේ. එසේ ම එය **වනස්පති** වෘක්ෂයක් වීම ද හේතුවකි. හින්දු ජන සමාජයේ ආගමික විශ්වාස අතර ඇසතු ගස හා සම්බන්ධ වූ ඇදහිලි රැසක් ම විය. ඔවුන් විටෙක බෝධි වෘක්ෂය **ඕංකාරයෙන්** පිදූ බවට සාක්ෂ්‍ය හමු වේ. බෞද්ධ සාහිත්‍ය හා වංශකථාගත තොරතුරුවලට අනුව ද බෝධියට සුවිශේෂ ස්ථානයක් හිමිව තිබූ බව පෙනේ. සිදුහත් කුමරුගේ උපත සිදු වූ දිනයේ උපන් **සහජාත** වස්තු සතෙන් එකක් ලෙස බෝධිය සුවිශේෂ වේ. අතීතයේ සමාජ සංස්කෘතිය තුළ බෝධිය හා සම්බන්ධ පුද පූජාවන්හි ස්වරූපය ඔප්නංවා පෙන්වීම මෙහි අරමුණ වශයෙන් යොදා ගැනේ. පූජාර්හ වෘක්‍ෂයක් ලෙස ඇසතු වෘක්ෂය සතු ඓතිහාසික වටිනාකම ද මෙහි දී අවධාරණය කරනු ලැබේ. ප්‍රෞඪ ඉතිහාසයකට උරුමකම් කියන ඇසතු වෘක්ෂ වන්දනාව ආරක්ෂා කරගැනීම බෞද්ධ ජන සමාජයේ ප්‍රධාන කාර්යභාරයක් වී ඇත.

**ප්‍රමුඛ පද :** ඇදහිලි, ඇසතු වෘක්ෂය, පුදපූජා, වනස්පති, වෘක්‍ෂ වන්දනාව